**ශීර්ෂය - 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 16 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාවිසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමණාකරනය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය තුළදී රු. 116,616,000 ක අග්‍රිම ඉල්ලුම් කිරීම සඳහා සැලසුම් කර තිබුණ අතර රු. 117,612,650 ක් ඉල්ලුම් කර තිබුණි. භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුවට නිකුත් කර තිබුණු අග්‍රිමය රු. 108,053,408 ක් විය. ඒ අනුව දෙපාර්තමේන්තුව ඉල්ලීමට සැලසුම් කරන ලද වටිනාකමින් සියයට 101 ක් හා ඉල්ලුම් කරන ලද මුදලින් සියයට 92 ක් භාණ්ඩාගාරය දෙපාර්තමේන්තුවට නිකුත් කර තිබුණි. | මෙම තත්ත්වයට හේතු වූයේ, අදාල මාසය තුළදී ඉල්ලුම් කරන ලද සම්පූර්ණ අග්‍රිමයන් ඒ අයුරින්ම එම මාසය තුළදී නොලැබීම නිසා, ඊ ළඟ මාසයට අදාලව අග්‍රිම ඉල්ලන අවස්ථාවේදී නොලද අග්‍රිමයන්ද ඒ ඒ මාසවල ඉල්ලුම් කිරීම නිසාය. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායී ලෙස සකස් කිරීමට අවශ්‍ය විසින් ගැනීමේ අවශ්‍යතාවය |

## 2.2 වියදම් කළමණාකරනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **ප්‍රතිපාදන මාරු කිරීම (මු.රෙ. 66)**<br><br>(i) 2020 වර්ෂය තුළ වැය විෂයයන් 2 ක ප්‍රතිපාදන මු.රෙ. 66 ප්‍රතිපාදන යටතේ සියයට 10 සිට සියයට 58 දක්වා වැඩි කිරීම් ද, වැය විෂයයන් 2 ක ප්‍රතිපාදන සියයට 13 සිට සියයට 16 දක්වා අඩු කිරීම්ද සිදුකර තිබුණි. | වැය විෂයය අංක 237 -1 -1 – 1001 , 237 -1-1-2001<br><br>වර්ෂය ආරම්භයේදී පැවති කාර්යය මණ්ඩල පුරප්පාඩු පිරවීමට රු. 562,000.00 ක්ද, හදිසි අළුත්වැඩියා කටයුත්තක් වෙනුවෙන්, රු. 175,000.00 ක්ද මු.රෙ. 66 මගින් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කරන ලදී.<br><br>වැය විෂයය අංක 237 -1 -1 – 2102<br><br>දෙපාර්තමේන්තුවට භාණ්ඩ පරිත්‍යාග ලෙස ලැබීම් නිසා ප්‍රතිපාදන ඉතිරිවීම හා එම ඉතිරිවීම් වලින් දෙපාර්තමේන්තුවේ හදිසියේ ඇති වූ නඩත්තු කටයුත්තක් වෙනුවෙන් මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගැනීමෙන් අදාල කටයුත්ත නිම කර ගැනීම. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායී ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ අවශ්‍යතාවය |

| | | | |
|---|---|---|---|
| | | වැය විෂයය අංක 237-1-1-1301<br>---------------------------<br>එසේම දෙපාර්තමේන්තු අවශ්‍යතාවය පරිදි ඇස්තමේන්තු සකස් කලද, Covid -19 තත්ත්වය මත වාහන ධාවනය සීමාවීම මත මෙම වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරිවූ අතර, ප්‍රතිපාදන අත්‍යාවශය වූ වැය විෂයන් සඳහා මෙමගින් මු.රෙ. 66 යටතේ මාරු කර ගැනීමට කටයුතු කරන ලදී. | |
| (ii) | **ඌන ඇස්තමේන්තු පිළියෙල කිරීම**<br>**----------------------------------------**<br>237-1-1-2509 (12) (ක්‍රම ලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම (PPPF) වෙනත් වැය විෂයය සඳහා වූ රු. 25,100,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු. 5,000,000 ක අතිරේඛ ප්‍රතිපාදනය ලබාගැනීම මඟින් සියයට 20 කින් වැඩිකර ගෙන තිබුණි. | Covid 19 වසංගත තත්ත්වය මත ණය ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද වීම හා ඒ අනුව IWWRMP ව්‍යාපෘතියේ සැලසුම් කර තිබූ ශක්‍යතා අධ්‍යයන ඇතුළු පෙර සූදානම් වැඩ සඳහා ගෙවීම් කිරීමේ කටයුතු ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම් සපයන වැඩසටහන (PPPF) තුලින් 2020 දෙසැම්බර් 31 දින දක්වා දැරීම හේතුකොට ගෙන ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ පෙර සූදානම් වැඩ සඳහා ගෙවීම් කිරීමට අතිරේක ප්‍රතිපාදන සපයා ගැනීමට සිදුවිය. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායී ලෙස සකස් කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 08 ක් සඳහා රු. 7,050,000 අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු. 2,672,571 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 99 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මෙම වැය විෂයයන්හි ඉතිරිවීම් පෙන්නුම් කරනුයේ Covid -19 වසංගත තත්ත්වය මත ආයතන වසා දැමීම, විදේශ සංචාර නවතා තිබීම, කාර්යාල වසා තැබීම නිසා කාර්යාල උපකරණ නඩත්තු වියදම් අඩුවීම, දේශීය පුහුණු වැඩසටහන් නොපැවැත්වීම හා නිල ඇඳුම් සඳහා හිමිකම ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම නිසා හා වරිපණම් ගාස්තු නියමිත වෙලාවට ගෙවීමේදී වට්ටම් හිමිවීම මත වියදම අඩුවීම නිසා ප්‍රතිපාදන ඉතිරිවිය. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායී ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ අවශ්‍යතාවය |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාරයේ SA 92 දරණ සමුච්චිත බැරකම් වාර්තාවේ දැක්වෙන එකතුව රු.783, 629 ක් වූ බැරකම් 04 ක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | මේ යටතේ දක්වා ඇති බැරකම් CIGAS වැඩසටහනෙහි අතපසු වීමකින් අගෝස්තු මසදී ඇතුලත් කරන ලද ගණුදෙනු වන අතර, ඒවා එම මාසය තුළදීම ගෙවීම් සිදු කර ඇත. තවද මෙම ගණුදෙනු දෙසැම්බර් මස CIGAS වැඩසටහනට ඇතුළත් කර නොමැති බව SA 92 භාණ්ඩාගාර මුද්‍රිත පත්‍රිකාවේ දිනවලින් තහවුරු වේ. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට උපදෙස් ලබාදුන් බව කාරුණිකව දන්වමි. | බැඳීම් හා බැරකම් නිසි පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 ඔක්තෝබර් 09 දිනැති අංක 2/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.4 ඡේදය පරිදි සටහන් අංක (iii) යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය යටතේ වන බැඳීම් හා බැරකම්, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු අතර එලෙස වාර්තා නොකළ කිසිදු බැඳීමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස ප්‍රවර්ථන වර්ෂයේ නිරවුල් නොකළ යුතු වුවත් භාණ්ඩාගාරයේ SA 92 සමුච්චිත බැරකම් වාර්තාවේ දක්වා නොතිබුණු එකතුව රු. 264,291 ක බැරකම් 2021 වර්ෂයේ නිරවුල් කර තිබුණි. | රු. 264,291 ක බැරකම් 2021 වර්ෂයේදී මු.රෙ. 94 (1) සහ (2) පරිදි නිරවුල් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුත වීම |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2020 වර්ෂය සඳහා සමස්ත කාර්යමණ්ඩලය 93 දෙනෙකුගෙන් සමන්විත වූ අතර කාර්යමණ්ඩල සාමාජිකයින් 08 දෙනෙකු සඳහා පමණක් පුහුණු අවස්ථාවක් ලබාදීමෙන් චක්‍රලේඛයේ ඡේද අංක 6.1 හා 6.3 අනුව සෑම සාමාජිකයෙකුටම පුහුණු අවස්ථාවක් ලබාදීම සිදු වී නැති බව නිරීක්ෂණය විය. | සියළු නිලධාරීන් වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කලද, 2020 වර්ෂයේ රටේ පැවති Covid තත්ත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි පුහුණු වැඩ සටහන් සඳහා නිලධාරීන් සහභාගි කරවීමට නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපරිම ප්‍රයත්න දැරිය යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මු.රෙ. 880 | ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැන්පත් තබා නොතිබුණි. | අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | |
| (ඇ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ 2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 | නිල නිවාසවලට අදාල ගොඩනැගිලි පිළිබඳ පූර්ණ හා නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත 2017 ඔක්තෝබර් 31 දිනට පෙර ඉදිරිපත් කළ යුතුව තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එලෙස තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි . | කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත නිසි පරිදි වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එහෙත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 අනුව මෙම දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස සම්බන්ධ තොරතුරු යැවීමේදී, නිල නිවාස වල මූල්‍ය වටිනාකම පමණක් එම වාර්තා වෙත ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. මේ වන විට මූල්‍ය වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගෙන ඇති බැවින්, එම තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යැවීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් සිදුකිරීම<br><br>චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතුවීම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1. සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3 (ආ) වගන්තිය ප්‍රකාරව, අදාල වර්ෂයට යාවත්කාලීන කල ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය හා දැනට සිටින කාර්යමණ්ඩලය, පිළිබඳ විස්තරය හා අපේක්ෂිත නිමවුම / ඉලක්ක 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කර නොතිබුණි. | ඉදිරියේදී සකස් කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් සඳහා ඇතුළත් කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම |
| (ආ) | ප්‍රසම්පාදන සැලැස්ම<br>2020 වර්ෂය සඳහා ගෘහභාණ්ඩ හා උපකරණ මිලට ගැනීම සඳහා රු. 1,300,000 ක ඇස්තමේන්තුගත අයවැය යටතේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද, රු. 465,611 ක් ගෘහභාණ්ඩ උපකරණ මිලට ගැනීමට වියදම් කර තිබූ අතර එය ඇස්තමේන්තුගත වියදමෙන් සියයට 36 ක් විය. | 2020 වර්ෂයේ ගෘහ භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද, එම වර්ෂයේදී ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයෙන්, අප දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය ගෘහ භාණ්ඩ හා උපකරණ ලබා ගැනීමට හැකි විය. එබැවින් සැලසුම් කල පරිදි ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් පැනගැණුනි. | අවශ්‍යතා නිසිපරිදි හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය |

### 3.1.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ 2401 වැය ශීර්ෂය යටතේ කාර්යමණ්ඩල පුහුණු සඳහා රු. 1,500,000 ක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද, පුහුණු අවස්ථාවන් 6 ක් වෙනුවෙන් නිලධාරීන් 8 දෙනෙකු සඳහා රු. 794,770 ක වියදමක් දරා තිබුණි. එය ඇස්තමේන්තුගත වියදමෙන් සියයට 53 ක් වන අතර ඉතිරිය සියයට 47 ක් විය. | රට තුළ පැවති Covid වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි පුහුණු වැඩසටහන් වලට නිලධාරීන් සහභාගි කරවීමට නොහැකි වීම. | අවශ්‍යතා නිසිපරිදි හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය |
| (ආ) | දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව ඇතුළත් කර යාවත්කාලීන කලයුතු වුවද, විගණනය දිනය වූ මැයි 12 වනවිටත් 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පමණක් ඇතුළත් කර තිබු බව නිරීක්ෂණය විය. | වෙබ් අඩවිය නිසි පරිදි යාවත්කාලීන කිරීමට සටහන් කර ගන්නා ලදී. | වෙබ් අඩවිය නිසි පරිදි යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව |

## 4. තිරසර සංවර්ධනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඒ යටතේ වූ දර්ශක ප්‍රධාන කරගනිමින් ආයතනයේ අරමුණු හා දර්ශක හඳුනාගැනීම හා ළඟා කරගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අවධානය යොමුකල යුතු වුවද, ඒ අනුව සමාලෝචිත වර්ෂයේ තිරසර සංවර්ධනයට අදාළව කටයුතු කර තිබූ බවට විගණනය වෙත විස්තර ඉදිරිපත් නොකෙරුණි. | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය භාරය වනුයේ ජාතික සංවර්ධන වැඩසටහන (National Development Framework) සකස් කිරීම හා එය සමග අනුගත වෙමින් අදාල අමාත්‍යාංශ සමඟ ප්‍රතිපත්ති තීරණ සහ එම අමාත්‍යාංශ වලින් සකස් කරන | ළඟා කර ගැනීමට හැකි තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින් අදාල සැලසුම් සකස් කිරීම හා අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කිරීම |

| | | |
|---|---|---|
| | ව්‍යාපෘති යෝජනා ඇගයීම වේ. ඒ අනුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින්, රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සකස් කිරීමේදී තිරසාර සංවර්ධන ඉලක්ක සහ අරමුණු සැලකිල්ලට ගන්නා ලදී. එමෙන්ම, ව්‍යාපෘති ඇගයීමේදී ද තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් නිරතුරුව දායකත්වය ලබා දෙන ආයතනයකි. | |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**5.1** **අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කාර්යමණ්ඩලය සඳහා පුද්ගල පඩිනඩි වියදම** | | |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු. 83,748,297 වැය කර තිබුණි. | | |
| **(ආ) අනුයුක්ත කාර්යමණ්ඩලය හා සත්‍ය කාර්යමණ්ඩලය** | | |
| i. දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව වූ තනතුරු 118 න් තනතුරු 25 ක් පුරප්පාඩුව පැවතීම නිසා එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 21ක් වී තිබුණු අතර,ජ්‍යෙෂ්ඨ මට්ටමේ අයත් අධ්‍යක්ෂ තනතුරු 05 ක්ද, සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 06 ක්ද ඇතුලත්ව තනතුරු 11 ක් වසර කිහිපයක සිට පුරප්පාඩුව පවතින බවත් බඳවා ගැනීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති බවත් දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණි. මෙම තත්ත්වය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය | දෙපාර්තමේන්තුවට අවශ්‍යය ඉඩකඩ පහසුකම් ලබාදෙන මෙන් මුදල් අමාත්‍යාංශය වෙත කිහිප අවස්ථාවකදී ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. ඉඩ පහසුකම් ලද පසු පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ඇත. | දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම |

| | | | |
|---|---|---|---|
| | ප්‍රශස්ත මට්ටමක තබාගැනීම කෙරෙහි බලපානු ලැබිය හැකි බව නිරීක්ෂණය විය. | | |
| ii. | ආයතන සංග්‍රහයේ 13.3 වගන්තිය ප්‍රකාරව, තනතුරකට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව කළයුතු වුවද, දෙපාර්තමේන්තුවේ පුස්තකාලාධිපති තනතුර අවුරුදු 08 කට වැඩි කාලයක් පුරප්පාඩුව ඇති බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපති තනතුරේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස රාජ්‍ය රාජ්‍ය සේවා අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම |